දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංකය:- 06/2019

මගේ අංකය - ඩී1/චක්‍රලේඛ

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09

2019.02. 28

සියළුම බන්ධනාගාර අධිකාරිවරුන් ,

සහකාර බන්ධනාගාර අධිකාරිවරුන් වෙත.

<u>විනය පරීක්ෂණ සම්බන්ධව සිදුකරනු ලබන මූලික විමර්ශන.</u>

විනය පරීක්ෂණ සම්බන්ධයෙන් ආයතන මඟින් මූලික විමර්ශන සිදුකරිමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන මෙන් මෙයින් දන්වමි.

1. මූලික විමර්ශන වාර්තා අස්ථාන ගතවීම් හැපැල මඟින් මූලස්ථානය වෙත මූලික විමර්ශන ගොනු එවනු ලැබුවත් සමහර අවස්ථා වලදී මූලික විමර්ශන ගොනු මූලස්ථානය වෙත නොලැබීම සඳහා පිළියමක් වශයෙන් මූලික විමර්ශනයට අදාළව සකස් කරන ලද මූලික විමර්ශන වාර්තාව මූලස්ථානයට යොමු කරන අවස්ථාවේ එහි (මූලික විමර්ශන) සහතික කරන ලද අනු ගොනුවක් මූලික විමර්ශන නිලධාරියා මඟින් සහතික කර ආයතනයේ තබාගත යුතුය.

2. විධිමත් විනය පරීක්ෂණ කටයුතු සිදුකරගෙන යන අවස්ථාවේදී හා විධිමත් විනය පරීක්ෂණ අවසන් වාර්තා පරීක්ෂා කිරීමේදී සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමට ප්‍රමාදවීමක් සිදුවීම අවශ්‍ය ප්‍රකාශන හා අත්‍යාවශ්‍ය ලේඛන ලබා නොගෙන බව පෙනීයන අතර එය පරීක්ෂණ කටයුතු සඳහා අවාසි සහගත ලෙස බලපානු ලබයි. එමනිසා සිදුවීමක් සිදුවූ සැනින් චූදිත නිලධාරියා/නිලධාරීන්, සිරකරුවන් හා ඊට අදාළ සාක්ෂිකරුවන්ගෙන් වහාම ප්‍රකාශ සටහන් කරගැනීමට අවශ්‍ය ලේඛන ලබා ගැනීමට කටයුතු කල යුතුය.

3. සිදුවීමක් දැනුම්දීමේදී, ප්‍රකාශ ලබා ගැනීමේදී හා චෝදනාපත්‍ර කෙටුම්පත් කිරීමේදී නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුවේ සඳහන් පරිදි නම සඳහන් කර එවිය යුතුය. (හැකිනම් පුද්ගලික ලිපිගොනු අංකය ද සඳහන් කරන්න)

එච්.එම්.එන්.සී. ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**එච්.එම්.එන්.සී. ධනසිංහ**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය,**
**කොළඹ 09.**